මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார நிலைபேறு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01 இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.09.19

**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකාව විදේශ ණය හිමියන් සමඟ දළ වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 17.5 ක ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය එකඟතාවයන්ට එළඹේ.**

ජාත්‍යන්තර ආයෝජකයින් නියෝජනය කරනු ලබන බැඳුම්කරහිමියන්ගේ තාවකාලික කණ්ඩායම (Ad Hoc Group of Bondholders - AHGB) හා දේශීය මූල්‍ය ආයතන නියෝජනය කරනු ලබන කණ්ඩායමක් වන ශ්‍රී ලංකාවේ දේශීය සමූහය (Local Consortium of Sri Lanka - LCSL) සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, (2023 වසර අවසන් වන විට) දළ වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 14.2 ක් වූ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ("බැඳුම්කර") හිමියන් සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයන්ට එළඹ ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (“ශ්‍රී ලංකාව”) මුදල් අමාත්‍යාංශය සතුටින් යුතුව ප්‍රකාශ කර සිටී. එක්ව ගත් විට බැඳුම්කරවලින් සියයට 50 කට වඩා මෙම කණ්ඩායම් දෙක සතු වේ.

රටේ අනාගත ආර්ථික කාර්යසාධනය මත පදනම් වූ විවිධ මට්ටමේ ණය සහන ශ්‍රී ලංකාවට ලබා දෙමින්, අවිනිශ්චිත ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ ප්‍රධාන කොන්දේසි සම්බන්ධයෙන් 2024 වසරේ ජූලි මස මුල දී බැඳුම්කර හිමියන්ගේ තාවකාලික කණ්ඩායම (AHGB) සමඟ ඇති කර ගන්නා ලද පළමු එකඟතාවයෙන් පසු එම කණ්ඩායම සමඟ මෙම ප්‍රතිපත්තිමය වශයෙන් ඇති කර ගන්නා ලද එකඟතාවයට එළඹිණි. එකඟ වන ලද කොන්දේසි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සහාය ලබා දෙන ශ්‍රී ලංකාවේ වැඩසටහනේ ණය තිරසාරභාවය පිළිබඳ විශ්ලේෂණය සමඟ පූර්ණ වශයෙන් අනුකූල වන බව තහවුරු කිරීම සඳහා, පසුගිය මාස කිහිපය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවට සුදුසු ණය සහන ලබා දීමේ අරමුණින් නිශ්චිත කොන්දේසි මාලාවක් පිළිබඳව අවසාන තීරණයකට එළඹීමට ශ්‍රී ලංකාවට හා බැඳුම්කර හිමියන්ගේ තාවකාලික කණ්ඩායමට (AHGB) හැකි විය.

වසරකට වඩා වැඩි කාලයක් පැවති සාකච්ඡාවලින් අනතුරුව ශ්‍රී ලංකාවේ දේශීය සමූහය (LCSL) සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් ඇති කර ගන්නා ලද එකඟතාවය ඇති වූ අතර, අවිනිශ්චිත නොවන ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දේශීය ණය හිමියන්ගේ කැමැත්ත එමඟින් පිළිබිඹු කරයි. අඩු කරන ලද සමුච්චිත මූලික ණය මුදලක් සහිත ඇමෙරිකානු ඩොලර් හා ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද නව ණය උපකරණ මිශ්‍රණයක් සඳහා දේශීය ණය හිමියන් විසින් දරනු ලබන බැඳුම්කර හුවමාරුවක් පිළිබඳ එමඟින් සැලසුම් කර ඇත.

එම කණ්ඩායම් දෙක සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වූ සම්පූර්ණ කොන්දේසි මාලාව, අද දින ආරම්භයේ සිංගප්පූරු කොටස් වෙළඳපොළ විසින් පළ කරන ලද ලේඛනයක දක්වා ඇති අතර, පහත සබැඳිය මඟින් එයට පිවිසිය හැක: [Sri Lanka - Announcement of Agreement in Principle - 19_09_2024.ashx (sgx.com)]

මෙම එකඟතා යටතේ, ඇමරිකානු ඩොලර් බිලියන 3.2ක පමණ ණය ප්‍රමාණයේ අඩුවීමකින් ශ්‍රී ලංකාව වහාම ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික පසුබෑමක් ඇති වුවහොත් උපරිම වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 4.6 දක්වා මෙය ඉහළ යා හැකි අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික කාර්යසාධනය සැළකිය යුතු ලෙස අපේක්ෂා කරන මට්ටම ඉක්මවා ගියහොත් ඇමරිකානු ඩොලර් බිලියන 2.0 ක අවම අගයක් දක්වා අඩු විය හැකිය.

මීට අමතරව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලික අවස්ථාව යටතේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් කාලසීමාව තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් දළ වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 9.5 කින් අඩු වනු ඇත. බැඳුම්කරවල සාමාන්‍ය කල් පිරීමේ කාලය වසර 5 ඉක්මවා දීර්ඝ කර ඇති අතර, පොලී අනුපාතය සාමාන්‍යයෙන් සියයට 6.4 සිට සියයට 4.4 දක්වා අඩු වේ.

මෙම එකඟතා යටතේ, සියයට 11 ක වට්ටම් අනුපාතයක් මත පදනම්ව ගණනය කරනු ලබන සියයට 40.3 ක සහනදායී වර්තමාන අගයකට මූලික අවස්ථාවේ දී  බැඳුම්කරහිමියන් එකඟ වනු ඇත. (සැළකිය යුතු ඉහළ ආර්ථික කාර්යසාධනයක ප්‍රතිඵලයක් ලෙස ඇති වන) උපරිම අවස්ථාව යටතේ, බැඳුම්කරහිමියන්ට ලැබෙන සහනයේ වර්තමාන අගය, ඒකාබද්ධ ක්‍රියාකාරී රාමුවට සාපේක්ෂව සියයට 27 සිට සියයට 33 දක්වා වැඩි වී ඇත.

ජූලි මාසයේ ඒකාබද්ධ ක්‍රියාකාරී රාමුව සමඟ සසඳන විට, උපරිම අවස්ථාව සඳහා කූපන් ගැලපීම් දළ වශයෙන් පදනම් අංක 160 කින් අඩු විය. ඒ හා සමානව, දෙවන උපරිම අවස්ථාව යටතේ කූපන් ගැලපීම් දළ වශයෙන් පදනම් අංක 60 කින් අඩු විය.

මාස කිහිපයක් මුළුල්ලේ විශ්වාසනීත්වය ඉහළ නැංවීම උදෙසා පැවති සාකච්ඡා වට කිහිපයකට පසුව, 2024 වසරේ මැයි මාසයේ දී මීට පෙර එකඟ වූ කොන්දේසි මාලාවක් මත පදනම්ව, දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.3 ක පමණ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අදාළ ප්‍රධාන මූල්‍ය කොන්දේසි පිළිබඳව, චීන සංවර්ධන බැංකුව සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයකට එළඹ ඇති බව ශ්‍රී ලංකාව විසින් සතුටින් දැනුම් දෙයි.

ශ්‍රී ලංකාවේ දිගුකාලීන රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලැබෙන වැඩසටහන යටතේ එකඟ වූ පරිදි, මෙලෙස බැඳුම්කරහිමියන්ගේ තාවකාලික කණ්ඩායම, ශ්‍රී ලංකාවේ දේශීය සමූහය සහ චීන සංවර්ධන බැංකුව සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයන්ට එළඹීම මඟින්, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අවසන් විය.

සමස්තයක් ලෙස, චීනයේ එක්සිම් බැංකුව සහ ශ්‍රී ලංකාවේ නිල ණය හිමියන්ගේ කමිටුවේ සාමාජිකයින් මෙන්ම චීන සංවර්ධන බැංකුව (CDB) සහ බැඳුම්කර හිමියන් සමඟ දැනටමත් ඇතිකරගෙන ඇති එකඟතාවයන් හේතුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් කාලසීමාව තුළ ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් බිලියන 17 කට අධික ණය සේවා සහනයක් (චීනයේ එක්සිම් බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක් ද, නිල ණයහිමි කමිටුව වෙතින් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.9ක් ද, චීන සංවර්ධන බැංකුව වෙතින් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 ක් සහ බැඳුම්කර හිමියන්ගෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 9.5ක්) ලබාගෙන ඇත.

මෙම ක්‍රියාවලිය පුරාවට ඔවුන් සද්භාවයෙන් කටයුතු කිරීම සහ ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකාව, සියළුම ණය හිමියන්ට මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ නිල ණය හිමියන්ගේ කමිටු ලේකම් කාර්යාලයට සිය හදපිරි කෘතඥතාව පළ කරයි.